# වාර්ෂික වාර්තාව

# 2017

## පටුන

පිටු අංකය

**කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය ... I**

**කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය .. II**

**කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය ... III**

1. කම්කරු දෙපාර්තමේන්තුව .................................... 1
2. කාර්මික සාමය සුරක්ෂිත කිරීම .................................... 4
3. සමාජ ආරක්ෂණය .................................... 11
4. සමාජ කතිකාවත .................................... 14
5. කර්මාන්තමය සුරක්ෂිතතාවය සහ වෘත්තීය ස්වස්ථතාවය .................................... 16
6. ශ්‍රම ප්‍රමිති .................................... 18
7. සේවයේ නියුතු කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම .................................... 20
8. විශේෂ විමර්ෂණ කටයුතු .................................... 21
9. පරිපාලන කටයුතු .................................... 22
10. ප්‍රගති අධීක්ෂණය සහ සමාලෝචන කටයුතු .................................... 25
11. මූල්‍ය කළමනාකරණය .................................... 26
12. කම්කරු ක්ෂේත්‍රයට සම්බන්ධ සංඛ්‍යාලේඛන ප්‍රකාශන කටයුතු .................................... 28
13. තොරතුරු තාක්ෂණික කටයුතු .................................... 29
14. කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු .................................... 30

## කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය

පෞද්ගලික අංශයේ සේවකයන්ට බලපාන කම්කරු නීති අණ පනත් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධානතම රාජ්‍ය ආයතනය කම්කරු දෙපාර්තමේන්තුව වන අතර සමස්ත පෞද්ගලික අංශයට බලපාන කම්කරු නීති අණ පනත් 63ක් ක්‍රියාත්මක කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කාර්යභාර්ය වේ.

මීට අමතරව කාර්මික ආරවුල් විසඳීම, වැඩවර්ජන වලට මැදිහත්ව පාර්ශවයන් සමථකරණය, සමාජ කතිකාවත ප්‍රවර්ධනය, සාමූහික ගිවිසුම්වලට එළඹීමට අවශ්‍ය මැදිහත් වීම, කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අදාළ ශ්‍රම ප්‍රමිතීන් සැකසීම සහ නියාමනය, සේවක අර්ථසාධක අරමුදල ප්‍රවර්ධනය සහ අධීක්ෂණය, ළමා හා කාන්තාවන් සේවයේ යෙදවීම සම්බන්ධ නීතිමය කටයුතු සහ සන්නිවේදන කාර්යභාරය, කර්මාන්ත අංශයෙහි වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යමය ආරක්ෂාව සඳහා විධිමත් ක්‍රමවේදයන් හඳුන්වා දීම ආදී වූ පුළුල් විෂය ක්ෂේත්‍රයක් දෙපාර්තමේන්තුව මගින් ආවරණය කරනු ලැබේ.

නව ලොවට ගැලපෙන ලෙස කම්කරු දෙපාර්තමේන්තුව නවීකරණය කිරීම කාලීන අවශ්‍යතාවයක් වන අතර එය මහජන හිතකාමී දෙපාර්තමේන්තුවක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ කටයුතු මේ වන විට ප්‍රශස්ත මට්ටමක පවතී. තව ද කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යභාර්ය වඩාත් ශක්තිමත්ව හා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා නවක කම්කරු නිලධාරීන් 179 දෙනෙකු බඳවාගැනීම ද මෙම වර්ෂයේ දී සිදුකරන ලද සුවිශේෂී කාර්යයකි.

මෙම වර්ෂයේ නොවැම්බර් මස ආර්ජන්ටිනාවේ පැවැත් වූ ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ගෝලීය සමුළුව සඳහා මා සහභාගී වූයේ ඉහල මට්ටමේ තාක්ෂණික සාකච්ඡා, අත්දැකීම් හුවමාරුකර ගැනීම් හා සාර්ථක හා නව ප්‍රතිපත්ති වැඩසටහන් මගින් උගත් පාඩම් තුළින් 2020 වර්ෂයේ දී ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා වන මෙම දෙපාර්තමේන්තුවේ මාහැඟි කර්තව්‍ය ඉටුකරලීමේ අභිලාෂයෙනි.

කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික අරමුණු සහ ඉලක්ක සපුරා ගැනීමට සහය දුන් දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පිරිනමන අතර සිය කාර්යයන් අඛණ්ඩව සිදුකිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**ඩබ්ලිව්.ඩී.ජේ සෙනෙවිරත්න**

*කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය*

## කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධානතම ආයතනයක්වන කම්කරු දෙපාර්තමේන්තුව, පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ට මෙන්ම සේව්‍යයන්ට ද ඉතා සමීප රාජ්‍ය ආයතනයකි. එම දෙපාර්තමේන්තුව 2017 වර්ෂය තුල ඉටුකළ කාර්යභාර්ය ඇතුලත් මෙම වාර්ෂික වාර්තාවට සුභ පැතුම් පණිවුඩයක් එක් කරනුයේ ඉමහත් සතුටිනි.

කම්කරු නීති සහ අනපණත් ක්‍රියාවට නංවමින්, සේවකයන්ගේ සේවා තත්ත්වය ඉහල නංවමින්, සමාජ කතිකාව තුළින් කාර්මික ආරවුල් අවම කර ගනිමින් සහ රට තුළ කාර්මික සාමය පවත්වා ගනිමින් සේව්‍ය සේවක දෙපාර්ශවයේම සුභ සිද්ධිය උදෙසා කම්කරු දෙපාර්තමේන්තුව සිදු කරන කාර්යභාර්ය සුවිශේෂ වේ.

ඒ අනුව, පෙර වසර වලදී මෙන්ම 2017 වර්ෂයේදී ද කම්කරු දෙපාර්තමේන්තුව සිය සේවාලාභීන් හට වඩා කාර්යක්ෂම සේවාවක් ලබා දීම උදෙසා අදාල පියවර ගෙන තිබීම ප්‍රශංසනීය වේ. ඒකාබද්ධ ශ්‍රමික පරීක්ෂණ ක්‍රියාවලිය විධිමත් කිරීම, වැඩවර්ජන සහ කාර්මික ආරවුල් අවම කිරීම සඳහා ක්‍රියාකිරීම, සේවා ස්ථාන වල ඇතිවන අනතුරු අවම කිරීමට ක්‍රියා කිරීම, දෙපාර්තමේන්තුවේ විවධ අංශ විසින් සේව්‍ය සේවක දෙපාර්ශවය දැනුවත් කිරිමේ වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම, සේවක අර්ථසාධක අරමුදල ප්‍රවර්ධනය සඳහා ක්‍රියාකිරීම ආදී කටයුතු වලට අමතරව ළමා ශ්‍රමය පිටුදැකීම උදෙසා ළමා ශ්‍රමය පිළිබඳ සමීක්ෂණ වාර්තාව (2015/2016) එළිදැක්වීම හා ළමා ශ්‍රමය සම්බන්ධව ප්‍රතිපත්තියක් දියත් කිරීම පසුගිය වසර තුළ දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට ඇතුළත් වේ. එසේම මෙම වර්ෂය තුළ නවක කම්කරු නිලධරයන් 179 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කර ඇති අතර එමඟින් කම්කරු පරීක්ෂණ වඩාත් ගුණාත්මකව සිදුකිරීමටත් පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදු කිරීමටත් ඉදිරි වසර වලදී සේවාලාභීන් වෙත වඩාත් ප්‍රශස්ත සේවයක් ලබා දීමටත් හැකිවනු ඇත.

2017 වර්ෂයේ දෙපාර්තමේන්තු ඉලක්කයන් සපුරා ගැනීම උදෙසා කටයුතු කළ කම්කරු කොමසාරිස් ජනරාල්තුමා ඇතුළු සමස්ත කාර්යමණ්ඩලය වෙත මගේ උණුසුම් සුභපැතුම් පිරිනමමි.

**එස්. ඒ. එන්. සරණතිස්ස**
ලේකම්
*කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය*

## කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය

කම්කරු දෙපාර්තමේන්තුවේ ආරම්භය සනිටුහන් වනුයේ 1923 වසරේදීය. එදා සිට මේ දක්වා ගතවූ දීර්ඝ කාල පරිච්ඡේදය තුලදී කාර්මික සාමය රට තුල ස්ථාපිත කිරීමටත්, යහපත් සේවා තත්ත්වයක් ඇති කිරීමටත්, වැඩ පරිසරය සුරක්ෂිත කිරීමටත් පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සැලසීමටත් දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත. තවද අප රට තුල ළමා ශ්‍රමය අවම කිරීමට කම්කරු දෙපාර්තමේන්තුවට හැකිවී ඇති බවද වෙසෙසින් සඳහන් කරමි.

2017 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ කාර්යයන් ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව වැඩි කිරීම, පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම, සේවකයින් සහ සේවා යෝජකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, සේවක අර්ථසාධක අරමුදල ප්‍රවර්ධන කටයුතු හා කර්මාන්තශාලා පරීක්ෂා කිරීමේ සහ වෘත්තීය සුරක්ෂිතතා විගණන සංඛ්‍යාව වැඩි කිරීම යනාදිය මෙම වසර තුල ඉහළ කාර්ය සාධනයක් අත්කර ගැනීම සඳහා බෙහෙවින් දායකවී ඇත.

තවද, 2017 වර්ෂයේ මැද භාගයේදී කම්කරු කොමසාරිස් ජනරාල්වරයා ලෙස මා රාජකාරි කටයුතු භාරගන්නා විටත් නව ලොවට ගැලපෙන ලෙස දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහාවන කටයුතු ආරම්භකර තිබුණි. එහි මූලික පියවරක් ලෙස නවක කම්කරු නිලධාරි පිරිසක් බඳවාගෙන ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබා දෙන ලදී. ඉදිරි වර්ෂ තුලදී කම්කරු පරීක්ෂණ වඩාත් ගුණාත්මකව සිදු කිරීමටත් ආරවුල් විසඳීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමටත් අපේක්ෂා කෙරේ. තවද, 2017 වර්ෂය තුලදී කම්කරු දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට පියවර ගෙන ඇත. අවිස්සාවේල්ල සහ මීගමුව කම්කරු කාර්යාල සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු මේ වසර තුල අවසන්කර ඇති අතර කම්කරු කාර්යාල එකොළහක ගොඩනැගිලි සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී. ඒ අනුව ඉදිරි වර්ෂ තුලදී සිය සේවා ලාභීන්ට වඩාත් කාර්යක්ෂම සේවාවක් සැලසීමට කම්කරු දෙපාර්තමේන්තුවට හැකිවනු ඇත. එමෙන්ම, සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් සඳහා විවිධ අංක ලබාදීම වෙනුවට සේවක අර්ථසාධක අරමුදල් අංකය ලෙස ජාතික හැඳුනුම්පත් අංකය හඳුන්වා දීමටද තීරණයකර ඇත.

2017 වර්ෂය තුල ඉහළ කාර්ය සාධනයක් සාක්ෂාත් කර ගැනීමට දායකවූ කම්කරු දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ට මාගේ හෘදයාංගම කෘතඥතාවය පිරිනමමි. එසේම, කම්කරු දෙපාර්තමේන්තුවට නිසි මඟ පෙන්වන සහ ධෛර්යය ලබා දෙන කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශයටද මාගේ හෘදයාංගම කෘතඥතාවය පුදකර සිටිමි.


**ඒ. විමලවීර**
*කම්කරු කොමසාරිස් ජනරාල්*
*කම්කරු දෙපාර්තමේන්තුව*

# කම්කරු දෙපාර්තමේන්තුව

1923 අංක 01 දරන ඉන්දියානු ආගාමික කම්කරු ආඥා පනතට අනුව 1923 වර්ෂයේදී කම්කරු දෙපාර්තමේන්තුව පිහිටුවන ලද්දේ ශ්‍රී ලංකාවේ වතුවල සේවය කිරීම සඳහා ඉන්දියාවේ සිට මෙරටට සංක්‍රමණය වූ කම්කරුවන්ට සුබසාධනය සැපයීමේ අරමුණිනි්ය. වර්තමානයේදී මෙම දෙපාර්තමේන්තුව අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ශ්‍රී ලාංකික වැඩකරන ජනතාවගේ රැකියා සුරක්ෂිතතාවය සහ සුබසාධනය වෙනුවෙන් ක්‍රියාත්මක වන ප්‍රමුඛ ආයතනය වේ.

ශ්‍රී ලංකා ආර්ථිකයෙහි වැඩි දායකත්වයක් උසුලන පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශයට අයත් ශ්‍රම බලකායේ වැටුප්, සේවා කොන්දේසි, රැකියා සුරක්ෂිතතාවය, වෘත්තීය සෞඛ්‍යය, සමාජ ආරක්ෂණය හා සුබසාධනය උදෙසා අදාල නීතිරීති සකස්කර ක්‍රියාවට නැංවීම සහ කාර්මික සාමය පවත්වා ගැනීම තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කරලීම කම්කරු දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වේ.

කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව ප්‍රධාන අංශ 13ක් ක්‍රියාත්මකව පවතින අතර, කලාප කම්කරු කාර්යාල 11ක් ද, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 ක් ද, උප කම්කරු කාර්යාල 17 ක් හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10ක් ද කම්කරු දෙපාර්තමේන්තුවේ කටයුතු විමධ්‍යගත කිරීම යටතේ දිවයින පුරා පිහිටුවා ඇත. 2017 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය 2495 කි.



**කම්කරු දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ කාර්යභාරය**

**දැක්ම**

ජාත්‍යන්තර තරඟකාරී ආර්ථිකයක් සඳහා කාර්මික සාමය තහවුරු වූ රටක්


**මෙහෙවර**

කාර්මික සාමය තහවුරු වූ යහපත් වැඩ පරිසරයක් ස්ථාපිත කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියට දායක වීම

**කාර්යභාරය**

- කම්කරු සුභසාධනය හා ප්‍රවර්ධනය උදෙසා සුසැදි අණපනත් ක්‍රියාවට නැංවීම සහ කාර්මික ආරවුල් සමථයකට පත් කිරීම.
- කම්කරු ප්‍රජාව පාදක කරගත් සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කම්කරු ක්ෂේත්‍රය පිළිබඳව සමීක්ෂණ පැවැත්වීම, කම්කරු ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට හා කම්කරු ප්‍රජාවගේ අභිවෘද්ධියට පාදක වන ව්‍යාපෘති හඳුනාගැනීම, සැලසුම් සකස් කිරීම, බාහිර හා අභ්‍යන්තර දැනුවත් කිරීමේ හා අධ්‍යාපනය ලබාදීමේ කටයුතු සිදු කිරීම.
- කම්කරු ක්ෂේත්‍රයට අදාළ පාර්ශවකරුවන් අතර සමාජ කතිකාවත ප්‍රවර්ධනය කිරීම.
- කම්කරු ක්ෂේත්‍රයට අදාළ සංඛ්‍යාලේඛන රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා ඉදිරිපත් කිරීම.
- වෘත්තීය සමිති සමග සබඳතා යහපත්ව හා සජීවී අයුරින් පවත්වාගෙන යාම.
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිතයා වශයෙන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය සමග සහයෝගයෙන් හා සජීවී ආකාරයෙන් කටයුතු කිරීම.
- කම්කරු ක්ෂේත්‍රයට අදාලව ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම සඳහාවන වාර්තා සහ තොරතුරු සැකසීම

## කම්කරු දෙපාර්තමේන්තුවේ සංවිධාන සැකැස්ම




## කාර්මික සාමය සුරක්ෂිත කිරීම

### කම්කරු පරීක්ෂණ

ජාත්‍යන්තර තරඟකාරිත්වය හමුවේ දේශීය නිෂ්පාදන රැක ගනිමින් ජාතික ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා වැඩපොළ සහයෝගීතාවය සහ කාර්මික සාමය අත්‍යාවශ්‍ය සාධකයන් වේ. ඒ සඳහා කම්කරු පරීක්ෂණ මගින් විශාල පිටුවහලක් ලැබේ. විධිමත් කම්කරු පරීක්ෂණ ක්‍රියාවලියක් තුලින් වැඩපොළ අනතුරු අවම කිරීමත්, නියමිත වැටුප් හා කොන්දේසි ක්‍රියාත්මක කිරීමත්, සේවකයන්ගේ විශ්‍රාමික දිවිය සඳහා සමාජ ආරක්ෂණය ඇති කිරීමත් කාර්මික සාමය ස්ථාපනයවීමත් සිදු වේ.

2017 වර්ෂයේදී කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සිදුකල ඒකාබද්ධ ශ්‍රමික පරීක්ෂණ සංඛ්‍යාව 61073 කි.




2017 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී කම්කරු නිලධාරි තනතුරු පුරප්පාඩු සඳහා නවක කම්කරු නිලධාරීන් 179 දෙනෙකු සේවයට බඳවා ගන්නා ලද අතර ඔවුන්ගේ සේවය ඉදිරි වසරවලදී ඵලදායීව ප්‍රයෝජනයට ගැනීම තුලින් කම්කරු පරීක්ෂණ ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකවද ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.


ඒ අනුව 2018 වර්ෂයේදී කාලීන පරීක්ෂණ 90000ක් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.




බඳවා ගන්නා ලද නවක කම්කරු නිලධාරීන් සිය පත්වීම් අතිගරු ජනාධිපතිතුමාගේ සුරතින් ලබා ගත් අවස්ථාව

**කාර්මික ආරවුල් විසඳීම**

කම්කරු දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මගින් ක්‍රියාත්මක කළ විවිධ වැඩසටහන් මගින් 2017 වර්ෂයේදීද කම්කරු ආරවුල් ප්‍රමාණය අවම වීමට බලපා ඇති අතර, ඒ පිළිබඳව විමර්ශනය කිරීමේදී දෘශ්‍යමාන හේතු ලෙසට සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සහ කම්කරු දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මගින් ජනමාධ්‍ය ඉවහල් කර ගනිමින් කරනු ලැබූ විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල් වීම යන කරුණු බලපා ඇති බව පෙනී යයි.





2017 වර්ෂය තුල ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම් කඩවීම පිළිබඳව ලද පැමිණිලි සංඛ්‍යාව සැලකිල්ලට ගත් කල වැටුප් හා අතිකාල දීමනා ගෙවීම්, පාරිතෝෂික ගෙවීම් හා සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් පිළිබඳව පැමිණිලි වැඩි ප්‍රමාණයක් ලැබී ඇත. ඒ අනුව මෙම තත්ත්වය පිළිබඳව සැලකිල්ලක් දක්වා මෙම පැමිණිලි ඉදිරි වර්ෂයන්හිදී අඩුකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් ප්‍රමුඛතාවයදී කටයුතු කරනු ලැබේ. මෙම වර්ෂයේ අවසන් දිනට ශේෂවී ඇති පැමිණිලි ඉදිරි වර්ෂය තුලදී කඩිනමින් අවසන් කිරීම සඳහා අදාල දිස්ත්‍රික් හා උප කාර්යාල වෙත උපදෙස් ලබාදී ඇති අතර පැමිණිලි වැඩි ප්‍රමාණයක් ශේෂවී ඇති කම්කරු කාර්යාලයන් ප්‍රධාන කාර්යාලය විසින් අඛණ්ඩව අධීක්ෂණයකරමින් පැමිණිලි විසඳීම කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග සකස්කර ඇත.

**සාමූහික ගිවිසුම් ලියාපදිංචි කිරීම**

සේවකයන්ට කම්කරු නීති රීතිවලින් ලබාදී ඇති අයිතිවාසිකම් සහ වරප්‍රසාදවලට වඩා වැඩි වරප්‍රසාද ලබා ගැනීමට සාමූහික ගිවිසුම් නිසා හැකි වේ. ඒ අනුව, 2017 වර්ෂය තුල ලියාපදිංචි කරන ලද සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 23ක් වන අතර 2017.12.31 දිනට ක්‍රියාත්මක සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 62කි. පසුගිය වසර කිහිපය තුල ලියාපදිංචි කරන ලද සාමූහික ගිවිසුම් සංඛ්‍යාවේ ක්‍රමික අඩුවීමක්


පෙන්නුම් කෙරෙන බැවින් සාමූහික ගිවිසුම් සඳහා සමාජ කතිකාවත තුලින් පෙළඹවීමක් සිදු කිරීමට දෙපාර්තමේන්තුව විසින් උත්සාහ ගනු ලැබේ.




**කාර්මික අධිකරණ කටයුතු**


කාර්මික අධිකරණයෙහි ප්‍රධාන අරමුණ වනුයේ කාර්මික ආරවුල් නිරවුල් කිරීම වන අතර කාර්මික අධිකරණය විසින් ප්‍රදානයන් ලබා දීම, ලබා දුන් ප්‍රදානයන් සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් ඉල්ලීම පරිදි අර්ථ නිරූපණ ලබා දීම හා බේරුම්කරණ ප්‍රදානයන්ට විරුද්ධව රිට් ආඥා ලබාගන්නා විට නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධවී කටයුතු කිරීම සිදු කරනු ලැබේ.

එසේම, කම්කරු දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පැමිණිලි අතරින් කිසිදු කම්කරු නීතියක් යටතේ ආවරණය නොවන, ව්‍යවස්ථාපිත හිමිකම් කඩවීමක් සම්බන්ධයෙන් නොවන හෝ කාලාවරෝධයට ලක්වූ පැමිණිලි බේරුම්කරණය සඳහා යොමු කරනු ලැබේ. ඒ අනුව, දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සමස්ත පැමිණිලි අතරින් ඉතා සුළු සංඛ්‍යාවක් පමණක් බේරුම්කරණය සඳහා යොමු කෙරේ. 2017 වර්ෂයේදී කාර්මික අධිකරණ කටයුතු සඳහා සාමාජිකයන් 17දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් පත්කර ඇති අතර එමගින් පැමිණිලි කඩිනමින් විසඳීමට පියවර ගනු ලැබේ.




**වෘත්තීය සමිති කටයුතු**


2017 වර්ෂය තුලදී ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති / සම්මේලන සංඛ්‍යාව 115ක් වන අතර වෘත්තීය සමිති ආඥා පනතේ විධිවිධාන අනුව ලියාපදිංචිය අහෝසිවූ වෘත්තීය සමිති / සම්මේලන සංඛ්‍යාව 85කි. ඒ අනුව 2017 වර්ෂය අවසන්වන විට ක්‍රියාත්මක සමස්ත වෘත්තීය සමිති / සම්මේලන සංඛ්‍යාව 1815 කි. ලියාපදිංචිය අහෝසිවන වෘත්තීය සමිති / සම්මේලන සංඛ්‍යාව පසුගිය වසර කිහිපය තුල ක්‍රමිකව අඩුවී ඇති අතර වෘත්තීය සමිතිවල ක්‍රියාකාරීත්වය පිළිබඳව සාමාජිකයන්ගේ දැනුවත් භාවය වැඩිවීම එයට හේතුවී ඇත.



**සේවය අවසන් කිරීමේ කටයුතු**

අන්තනෝමතිකව හා අසාධාරණ ලෙස සේවය අවසන් කිරීම අවම කිරීම, පාරිසරික වෙනස්වීම්වල ප්‍රතිවිපාක ලෙස සේවය අහිමිවන සේවකයින් හට සාධාරණ හා යුක්ති සහගත අයුරින් සහන සැලසීම, ආර්ථික වර්ධනයත් සමඟ සිය ව්‍යාපාර ශක්තිමත් කිරීමට ගන්නා උපායමාර්ග වලදී අතිරික්ත සේවකයින් කඩිනමින් ඉවත් කිරීමට ව්‍යාපාරික ප්‍රජාවට සහන සැලසීම ආදී කටයුතු කම්කරු දෙපාර්තමෙන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.


සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් 2017 වර්ෂය තුල ලැබුනු පැමිණිලි සංඛ්‍යාව 125ක් වන අතර වර්ෂය තුල විසඳූ සංඛ්‍යාව 80කි.




සේවය අවසන් කිරීම සම්බන්ධ ඉල්ලුම්පත් 36ක් 2017 වර්ෂය තුල ලැබී ඇති අතර සේවය අවසන් කිරීම සම්බන්ධ ඉල්ලුම්පත් සම්බන්ධයෙන් අවසරදීම් 24ක් සිදුකර ඇත.

**වැඩ වර්ජන වාර්තා වීම්**

අර්ධ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සේවක ප්‍රජාව විසින් 2017 වර්ෂයේදී සිදු කරන ලද වැඩවර්ජන සංඛ්‍යාව 33 ක් ලෙස වාර්තා වී ඇත. එම වැඩවර්ජන උදෙසා සහභාගි වූ සේවක සංඛ්‍යාව 10,312 ක් වන අතර, එම වැඩ වර්ජන හේතු කොටගෙන අහිමි වූ මිනිස් දින ගණන 58,279 ක් වේ.




**පසුගිය පස්වසර තුල වැඩ වර්ජන වාර්තාවීම්**

| | | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|
| වැඩ වර්ජන වාර්තා වීම | වතු | 22 | 31 | 20 | 35 | 12 |
| | ආයතන | 20 | 07 | 16 | 20 | 21 |
| සහභාගිවූ සේවක සංඛ්‍යාව | වතු | 5031 | 4833 | 5229 | 18355 | 1885 |
| | ආයතන | 6088 | 1618 | 3171 | 10317 | 8427 |
| අහිමිවූ මිනිස් දින සංඛ්‍යාව | වතු | 41669 | 29165 | 29743 | 123151 | 5643 |
| | ආයතන | 38754 | 8158 | 8630 | 18840 | 52636 |

**නීති කටයුතු**

කම්කරු නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමද ඒ තුළින් සේවා සේවක අයිතීන් සුරක්ෂිත කරමින් සේවා සේවක සහයෝගීතාවය වර්ධනය කිරීමද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වේ.

ඒ අනුව, 2017 වර්ෂය තුල දිවයින පුරා කම්කරු කාර්යාලවල පවරන ලද නඩු පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අදාල පනත | 2017.01.01 දිනට ශේෂය | වර්ෂය තුල පවරන ලද නඩු සංඛ්‍යාව | අවසන් නඩු සංඛ්‍යාව | නඩු මගින් අයකරගත් මුදල රු. | නඩු මගින් අයවිය යුතු මුදල රු. |
|---|---|---|---|---|---|
| 1.පාරිතෝෂික පනත | 2706 | 1363 | 761 | 125,186,398.00 | 130,505,316.00 |
| 2.කාර්මික ආරවුල් පනත | 253 | 40 | 8 | 1,275,836.00 | 136,650.00 |
| 3.සේවය අවසන් කිරීමේ පනත | 9 | 13 | - | - | 23,767,677.45 |
| 4.පඩිපාලක සභා ආඥා පනත | 547 | 115 | 22 | 2,337,852.00 | 7,346,025.93 |
| 5.සාප්පු හා කාර්යාල පනත | 161 | 41 | 8 | 296,264.00 | 20,388,024.05 |
| 6.කම්කරු විනිශ්චය සභා නියෝග | 449 | 62 | 16 | 2,699,358.00 | 35,181,727.68 |
| 7.කාන්තා හා ළමා පනත | 14 | 6 | - | - | - |
| 8.සේවක අර්ථසාධක අරමුදල් පනත | 9013 | 2343 | 2159 | 2,141,840,039.00 | 2,066,196,116.45 |
| 9.ප්‍රසූතිකාධාර පනත | 1 | 2 | - | - | - |
| 10.අයවැය සහන දීමනා පනත | 31 | 23 | - | - | 2,500,695.60 |
| 11.අනුමත අර්ථසාධක අරමුදල් | 0 | 4 | - | - | 865,000.00 |

2017 වර්ෂය තුල අධිකරණවල ගොනුකල නඩු පිළිබඳ තොරතුරු

| අධිකරණය | 2017.01.01 දිනට ශේෂය | ගොනුකල නඩු සංඛ්‍යාව | අයවිය යුතු මුදල (රු) | අවසන් නඩු සංඛ්‍යාව | අයකරගත් මුදල (රු) |
|---|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 148 | 33 | - | 02 | - |
| අභියාචනාධිකරණය | 301 | 35 | - | 10 | - |
| මහාධිකරණය | 167 | 104 | - | 98 | - |
| දිසා අධිකරණය සහ වානිජ මහාධිකරණය | 257 | 11 | 3,132,454,228.41 | 58 | 255,528,784.03 |
| මහේස්ත්‍රාත් අධිකරණය | 15,140 | 4,012 | 2,286,887,233.16 | 2,974 | 2,273,635,747.00 |

**සමාජ ආරක්ෂණය**


ශ්‍රී ලංකාවේ සේවක ප්‍රජාවගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත කිරීම සඳහා ආකර්ෂණීයම සමාජ ආරක්ෂණ ක්‍රමය වන සේවක අර්ථසාධක අරමුදල කම්කරු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලැබේ.

ඒ අනුව, 2017 වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදල සඳහා ලියාපදිංචි කරන ලද සේවායෝජකයින් සංඛ්‍යාව 6507ක්වන අතර ලියාපදිංචි කරන ලද සේවකයින් සංඛ්‍යාව 454,971 කි.

**දායක මුදල් රැස් කිරීම**

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතින් ආවරණය කරනු ලබන සියළුම සේවකයින් වෙනුවෙන් යම් මාසයක දායක මුදල් අදාල සේවා යෝජකයන් විසින් ඊළඟ මාසයේ අවසන් දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කල යුතුය. දිවයින පුරා පිහිටි සියළුම කම්කරු කාර්යාලවල සේවක අර්ථසාධක අරමුදල් අයකිරීම් අධීක්ෂණ තොරතුරු පද්ධතිය ස්ථාපනයකර ඇති බැවින් දායක මුදල් අයකර ගැනීම වඩාත් කාර්යක්ෂමවී ඇත.

*පසුගිය වසර 5ක කාල සීමාව තුල දායක මුදල් රැස් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.*




**ඇඟිලි සලකුණු ලියාපදිංචිය**

ප්‍රධාන කාර්යාලය මගින් 2017 වර්ෂයේදී සාමාජිකයන් 12,600 ක් සඳහා ඇඟිලි සලකුණු ලියාපදිංචිකර ඇත. වර්තමානය වන විට ප්‍රධාන කාර්යාලයට අමතරව කම්කරු කාර්යාල 23ක ඇඟිලි සලකුණු ලියාපදිංචි කිරීමේ පද්ධතිය ස්ථාපිත කර ඇත.

*සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රගතිය*

<table>
<tr><th colspan="2"></th><th>2016.12.31 දිනට</th><th>2017.12.31 දිනට</th></tr>
<tr><td colspan="2">සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව</td><td>17,131,226</td><td>17,314,362</td></tr>
<tr><td colspan="2">මුළු සේවායෝජක සංඛ්‍යාව</td><td>223,114</td><td>222,735</td></tr>
<tr><td colspan="2">අරමුදලේ වටිනාකම (රු. මිලියන)</td><td>1,841,497</td><td>2,066,299</td></tr>
<tr><td colspan="2">සක්‍රිය සාමාජික සංඛ්‍යාව (මිලියන)</td><td>2.61</td><td>2.61</td></tr>
<tr><td colspan="2">සක්‍රිය සේවායෝජක සංඛ්‍යාව</td><td>73,482</td><td>75,756</td></tr>
<tr><td rowspan="2">නව ලියාපදිංචි කිරීම්</td><td>සාමාජිකයන්</td><td>620,806</td><td>454,971</td></tr>
<tr><td>සේවායෝජකයන්</td><td>7,178</td><td>6,507</td></tr>
<tr><td rowspan="2">ප්‍රතිලාභ ගෙවීම්</td><td>ප්‍රතිලාභීන් සංඛ්‍යාව</td><td>187,149</td><td>260,989</td></tr>
<tr><td>ගෙවූ ප්‍රතිලාභ මුදල<br>( රු. මිලියන)</td><td>108,393</td><td>117,477</td></tr>
<tr><td colspan="2">දායක මුදල් රැස් කිරීම ( රු. මිලියන )</td><td>118,327</td><td>133,353</td></tr>
<tr><td rowspan="2">සේ.අ.අ. නිවාස ණය</td><td>අනුමත කළ අයදුම්පත් සංඛ්‍යාව</td><td>12,780</td><td>10,998</td></tr>
<tr><td>අනුමත කල ණය මුදල් වටිනාකම (රු. මිලියන)</td><td>5,414</td><td>4,946</td></tr>
</table>

**සේවක අර්ථසාධක අරමුදල් 30% විශ්‍රාම පූර්ව ප්‍රතිලාභ ගෙවීමේ කටයුතු ප්‍රගතිය**

දිස්ත්‍රික් කම්කරු කාර්යාල හැර ප්‍රධාන කාර්යාලය වෙත ලද පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීමේ අයදුම්පත් සංඛ්‍යාව 31,033 ක් වන අතර සුදුසුකම් ලැබ භාරදෙන ලද "එස්" අයදුම්පත් සංඛ්‍යාව 21,315 කි. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව 21,699 කි.

*පසුගිය වසර තුන තුල සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව*

| ප්‍රතිලාභය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2015 වර්ෂය | 2016 වර්ෂය | 2017 වර්ෂය |
| විශ්‍රාම වයසට එළඹී සේවයෙන් ඉවත්වූ පසු සේ.අ.අ. ප්‍රතිලාභ ගෙවීම | 238063 | 87541 | 87268 |
| විවාහ හේතුමත සේවයෙන් ඉවත්වූ කාන්තා සාමාජිකාවන්ට ප්‍රතිලාභ ගෙවීම | 108614 | 22708 | 22426 |
| පූර්ණ දුබලතාවයට පත්වීම නිසා සේවයෙන් ඉවත්වීම හේතුවෙන් ප්‍රතිලාභ ගෙවීම | 7513 | 978 | 1048 |
| මියගිය සාමාජික ප්‍රතිලාභ | 4672 | 4496 | 4738 |
| 30% විශ්‍රාම පූර්ව ප්‍රතිලාභ | 678 | 69482 | 33014 |
| විදේශ රටක ස්ථිර පදිංචියට යෑම නිසා ප්‍රතිලාභ ගෙවීම | 13923 | 1755 | 1959 |
| රාජ්‍ය සේවයේ හෝ පලාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලැබීම නිසා සේවයෙන් ඉවත්වීම හේතුවෙන් ප්‍රතිලාභ ගෙවීම | 29453 | 10133 | 13488 |
| රාජ්‍ය සංස්ථාවක් /මණ්ඩලයක් වසා දැමීම, වියදම් අඩුකිරීමට සේවකයන් ඉවත්කිරීම හෝ සමාගමක් බවට පරිවර්තනය කිරීම හේතුවෙන් සේවය හැරගිය සේවකයන්ට ප්‍රතිලාභ ගෙවීම | 18165 | 108 | 2785 |

**සේවක අර්ථසාධක අරමුදල් ප්‍රවර්ධනය සහ කාර්යක්ෂමතා සංවර්ධන වැඩසටහන් ප්‍රගතිය**

සාමාජිකයන් වෙත සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් නිවැරදි දැනුවත්භාවයක් නොමැතිවීම හේතුවෙන් උද්ගතවන ගැටළු අවම කිරීම සඳහා සාමාජිකයන් සහ සේව්‍යයන් දැනුවත් කිරීම සඳහා රූපවාහිනී හා ගුවන්විදුලි දැන්වීම් ප්‍රචාරණය කිරීම 2017 වර්ෂයේදී සිදුකරන ලදී. එසේම ජංගම සේවා වැඩසටහන්ද පවත්වන ලදී.

**අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණ ප්‍රගතිය**

පෞද්ගලික අර්ථසාධක අරමුදල සඳහා ආයතන 149ක් දායකවන අතර සාමාජික සංඛ්‍යාව 192,342ක් වේ. අරමුදලෙහි දළ වත්කම් ප්‍රමාණය රු.221,086,931,366.97ක් වන අතර අදාල දළ ආයෝජන ප්‍රමාණය රු.135,680,427,446.75ක් වේ.

## සමාජ කතිකාව

සේවා සේවක දෙපාර්ශවය අතර සන්නිවේදනය, අදහස් විමසීම හා එක්ව තීරණ ගැනීම ප්‍රචලිත කිරීම සඳහා ඔවුන් අතර කතිකාව සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම තුළින් කාර්මික සාමය හා සංහිඳියාව පවත්වාගෙන යාමෙන් ආර්ථික සමෘද්ධිය උදාකර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව කැපවී සිටී.

ඒ අනුව, සමාජ කතිකාව ප්‍රවර්ධනය උදෙසා 2017 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් දිවයින පුරා පැවැත්වූ සමාජ කතිකා ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව 128 කි.

| වැඩසටහන | 2017 වර්ෂයේ පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගීත්වය |
|---|---|---|
| ආයතන වැඩමුළු | 60 | 2648 |
| කළමනාකරුවන් හා සේවකයන් සඳහා | 10 | 407 |
| අර්ධ රාජ්‍ය අංශය සඳහා | 12 | 545 |
| කලාප උපදේශන සභා | 8 | 277 |
| දිස්ත්‍රික් කාර්යාල උපදේශන සභා | 40 | 1333 |
| දිස්ත්‍රික් කාර්යාල ආයතන | 32 | 1155 |
| උප කම්කරු කාර්යාල ආයතන | 14 | 469 |













සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා සංකල්පය ප්‍රවර්ධනය සඳහා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩ සටහන්වල පසුවිපරම් හා ඇගයීම් ක්‍රියාවලියක් ලෙස සමාජ කතිකා හා වැඩපොල සහයෝගිතා දීප ව්‍යාප්ත තරගාවලිය සංවිධානය කොට පැවැත්වීම ද කම්කරු දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සිදු කරනු ලබන අතර 2017 වර්ෂයේදී ද එම තරගාවලිය සාර්ථකව පවත්වා ජයග්‍රාහකයන් වෙත සම්මාන පිරිනමන ලදී. සමාජ කතිකා හා වැඩපොල සහයෝගිතා

සංකල්පය ප්‍රශස්ත මට්ටමින් ක්‍රියාත්මක ආයතන ඇගයීම හා සේවක සේවිකාවන්ගේ නිර්මාණ කුසලතා ඇගයීම සඳහා ආයතන මට්ටමින් පැවැත්වෙන දීප ව්‍යාප්ත සමාජ කතිකා විශිෂ්ටතා සම්මාන තරඟාවලිය සහ ආයතනයන්හි සේවක/සේවිකාවන්ගේ නිර්මාණ තරඟාවලිය යන දෙඅංශයෙන් මෙම තරඟාවලිය පවත්වන ලදී.




සමාජ කතිකා හා වැඩපොල සහයෝගිතා දීප ව්‍යාප්ත තරගාවලිය - 2017

එසේම, සමාජ කතිකාව හා වැඩපොල සහයෝගිතාව පණිවිඩය ව්‍යාප්ත කිරීමේ අරමුණ ඇතිව ඒ පිළිබඳව සම්පාදනය වන ලිපි, රචනා හා නිර්මාණ එකතුවක් ලෙස වාර්ෂිකව එළිදක්වනු ලබන කතිකාව පුවත් සඟරාව 2017 වර්ෂයේදීද මුද්‍රණය කර එළිදක්වන ලදී.

## කර්මාන්තමය සුරක්ෂිතතාවය සහ වෘත්තීය ස්වස්ථතාවය

අනතුරු සහ උපද්‍රවයන්ගෙන් තොර සහ සෞඛ්‍යාරක්ෂිත සේවා පරිසරයක් සේවකයන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහල නැංවීමට ඉවහල්වන අතර නිෂ්පාදිත භාණ්ඩ හා සේවාවන්ගේ ගුණාත්මකභාවය උසස් කිරීමට ද හේතුවේ. ඒ අනුව, සේවා ස්ථානවල ඇතිවන ආපදා, අනතුරු සහ වෘත්තීමය රෝගාබාධ අවම කිරීම උදෙසා කම්කරු දෙපාර්තමේන්තුව ක්‍රියා කරනු ලැබේ.

2017 වර්ෂය තුලදී කර්මාන්තශාලා අනතුරු පරීක්ෂණ සහ පැමිණිලි විමර්ෂණ 4943ක් සිදුකර ඇතිඅතර අධි අන්තරාදායක යන්ත්‍ර සූත්‍ර පරීක්ෂණ 7530ක් සිදුකර ඇත. 2017 වර්ෂය තුල වාර්තාවී ඇති මරණීය අනතුරු 68ක සංඛ්‍යාව සහ මරණීය නොවන අනතුරු 1451ක සංඛ්‍යාව විමර්ෂණය කිරීමේ කටයුතුද සිදුකර ඇත. වැඩිම මරණීය අනතුරු සංඛ්‍යාවක් වාර්තාවී ඇත්තේ ඉදිකිරීම් ක්ෂේත්‍රය ආශ්‍රිතවවන අතර එම අනතුරු අවම කර ගැනීම සඳහා සේව්‍ය සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ වැඩසටහන් ඉදිරි වසරවලදී වැඩි වශයෙන් පැවැත්වීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.





සෑම වසරකම අප්‍රේල් 28 දිනට යෙදෙන ලෝක සුරක්ෂිතතා දිනය සැමරීම සඳහා 2017 වර්ෂයේදී කම්කරු දෙපාර්තමේන්තුව විසින් අවිස්සාවේල්ල ආයෝජන ප්‍රවර්ධන කලාපයෙහි ජාතික මට්ටමින් වැඩසටහනක් පවත්වන ලදි.



ලෝක සුරක්ෂිතතා දින සැමරුම් උත්සවය 2017

වෘත්තීය සුරක්ෂිතතා සතිය නිමිත්තකර පවත්වනු ලබන වැඩසටහන 2017 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී කොළඹ ගලධාරි හෝටලයේදී පවත්වන ලදී.

කර්මාන්තමය සුරක්ෂිතතාවය උදෙසා සිදුකල කර්මාන්තශාලා නව ලියාපදංචිකිරීම් සංඛ්‍යාව පහත වගුවෙන් දැක්වෙන අතර 2017.12.31 දිනට ලියාපදිංචි කරන ලද මුළු කර්මාන්තශාලා සංඛ්‍යාව 28,854 කි.




වෘත්තීමය රෝගාබාධ ඇතිවිය හැකි සේවා වටපිටාවන් පරීක්ෂා කිරීම සඳහා පාරිසරික මිනුම් 45ක් සිදුකර ඇති අතර සේවකයන් වෙත වෘත්තීය රෝගාබාධ හෝ රෝග ලක්ෂණයන් පවතීදැයි මූලික අවධියේදී හඳුනා ගැනිම උදෙසා සිදුකරන ලද ජීව විද්‍යාත්මක පරීක්ෂණ සංඛ්‍යාව 1235කි. වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් 271ක් සිදුකර ඇත.

කර්මාන්තමය සුරක්ෂිතතාවය සහ වෘත්තීය ස්වස්ථතාවය ප්‍රවර්ධනය උදෙසා 2017 වසර තුල දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කල දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව 399 කි.



වෘත්තිය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සේවකයින් දැනුවත් කිරීම - පැලවත්ත බ්‍රොම්බිල් තේ කර්මාන්තශාලාව



වෘත්තිය සුරක්ෂිතතාව සෞඛ්‍ය හා සුභසාධනය පිළිබඳ වැඩමුළුව - පොළොන්නරුව

## ශ්‍රම ප්‍රමිති

පෞද්ගලික අංශයේ සේවා නියුක්ත වූවන්ගේ රැකියා සුරක්ෂිතතාවය සහ සුභසාධනය කෙරෙහි බලපාන සේවා තත්ත්වයන් හා සේවා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සැකසීම හා ඒවාට නෛතික තත්ත්වයන් ලබා දීමට කටයුතු කිරීම හා අධීක්ෂණය කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරයකි.

ඒ අනුව, 2017 වර්ෂයේදී පහත කාර්යයන් සිදුකර ඇත.

- 2017 වර්ෂයට නියමිත කාලය අවසන් පඩි පාලක සභා දොළහක නියෝජිතයන් පත් කිරීමේ කටයුතු අවසන් කර පුවත්පත්වල පල කිරීම
- හෝටල් හා භෝජන සැපයීමේ කර්මාන්තයේ පඩි පාලක සභාවට අයත්වන සේවකයන්ගේ සේවා ගාස්තු පිළිබඳව අදාල පාර්ශවයන් හා සාකච්ඡා වාර දෙකක් පැවැත්වීම
- නාවික ප්‍රවාහනය මෙහෙයුම් සේවා කර්මාන්තෙයේ ආඥාව පුවත්පත් වල පල කිරීම
- අයවැය සහන දීමනා හා අවම වැටුප් පිළිබඳ ඇති පැමිණිලි සම්බන්ධයෙන් අදාල කමිටු තීරණ අනුව කටයුතු කිරීම
- දින පහේ සතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීම් 200ක් සිදු කිරීම
- සාමූහික ගිවිසුම් සඳහා නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම් 33ක් සිදු කිරීම
- 2016 අංක 03 දරන අවම වැටුප හා 2016 අංක 04 දරන අයවැය සහන දීමනාව හා සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද අත් පත්‍රිකා මුද්‍රණය කිරීම
- 2015 දෙසැම්බර් සිට 2017 ඔක්තෝබර් දක්වා කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වැවීමේ හා සැදීමේ කර්මාන්තයේ ජීවන වියදම් දීමනාව පුවත්පත්වල පල කිරීම
- මල්, විසිතුරු පැළ, එළවළු හා පළතුරු වගා කිරීමේ සහ අපනයනය කිරීමේ කර්මාන්තය සඳහා විරෝධතා කැඳවීම හා නිවේදන පුවත්පත්වල පල කිරීම

2017.12.31 දිනට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක පඩිපාලක සභා ලැයිස්තුව පහත දක්වා ඇත.

| පඩිපාලක සභාව | |
|---|---|
| වැවිලි අංශය | |
| 1. | තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය |
| 2. | කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වැවීමේ හා සැදීමේ කර්මාන්තය |
| 3. | රබර් වැවීමේ හා දළ රබර් සැදීමේ කර්මාන්තය |
| 4. | පොල් වැවීමේ කර්මාන්තය |
| **නිෂ්පාදන අංශය** | |
| 5. | ඉංජිනේරු කර්මාන්තය |
| 6. | මුද්‍රණ කර්මාන්තය |
| 7. | තේ පිටරට යැවීමේ කර්මාන්තය |
| 8. | රබර් පිටරට යැවීමේ කර්මාන්තය |
| 9. | මත්පැන් හා විනාකිරි කර්මාන්තය |
| 10. | ගිණි පෙට්ටි සැදීමේ කර්මාන්තය |

| | |
|---|---|
| 11. | පොල් නිපදවීමේ කර්මාන්තය |
| 12. | ගොඩනැගිලි කර්මාන්තය |
| 13. | බේකරි කර්මාන්තය |
| 14. | ගඩොල් හා උළු නිපදවීමේ කර්මාන්තය |
| 15. | අයිස්, සිසිල් බීම, පළතුරු යුෂ හා ජෑම් සෑදීමේ කර්මාන්තය |
| 16. | ගුදිරි කොහු හා ඇට කෙදි කොහු පිටරට යැවීමේ කර්මාන්තය |
| 17. | ඇඳුම් සෑදීමේ කර්මාන්තය |
| 18. | හොසියර් (මේස් භාණ්ඩ) සෑදීමේ කර්මාන්තය |
| 19. | වී කෙටීමේ කර්මාන්තය |
| 20. | රෙදි පිළි නිෂ්පාදන කර්මාන්තය |
| 21. | විස්කෝතු හා රසකැවිලි සෑදීමේ කර්මාන්තය |
| 22. | රබර්, ප්ලාස්ටික් හා පෙට්‍රෝලියම් රෙසින ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය |
| 23. | සම් පදම් කිරීම, පාවහන් හා සම් භාණ්ඩ සෑදීමේ කර්මාන්තය |
| 24. | පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය |
| 25. | ඉස්සන් බෝ කිරීමේ හා පිටරට යැවීමේ කර්මාන්තය |
| 26. | ගල් කොරි හා කළුගල් කැඩීමේ කර්මාන්තය |
| 27. | මිනිරන් කර්මාන්තය |
| 28. | කුරුඳු කර්මාන්තය |
| 29. | දුම්කොළ කර්මාන්තය |
| **සේවා අංශය** | |
| 30. | මෝටර් රථ ගමනාගමන කර්මාන්තය |
| 31. | සිනමා කර්මාන්තය |
| 32. | සාත්තු නිවාස කර්මාන්තය |
| 33. | හෝටල් හා භෝජන සැපයීමේ කර්මාන්තය |
| 34. | ආරක්ෂක සේවා කර්මාන්තය |
| 35. | පුවත්පත් කලාවේදී කර්මාන්තය |
| 36. | සිල්ලර හා තොග වෙළඳ කර්මාන්තය |
| 37. | නාවික ප්‍රවාහන හා මෙහෙයුම් සේවා ප්‍රවාහන කර්මාන්තය |
| 38. | පවිත්‍රතා සේවා කර්මාන්තය |
| **කම්කරු කොමසාරිස් තීරණ** | |
| 39. | බතික් කර්මාන්තය |
| 40. | වීදුරු භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය |
| 41. | පෙර පාසැල් කර්මාන්තය |
| 42. | බීඩි සෑදීමේ කර්මාන්තය |
| 43. | සුරුට්ටු කර්මාන්තය |
| 44. | මල්, විසිතුරු පැළ, එළවළු හා පළතුරු වගා කිරීමේ හා අපනයන කිරීමේ කර්මාන්තය |

## සේවයේ නියුතු කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ක්‍රියාවලිය තුළ විශේෂ දායකත්වයක් කාන්තා සේවා නියුක්තිය විසින් ඉටු කරනු ලබන අතර එම වැඩකරන කාන්තාවන්ගේ වෘත්තිය අයිතිවාසිකම් හා ආරක්ෂාව මෙන්ම ඔවුන්ගේ සෞඛ්‍යය හා සුභ සාධන පහසුකම් සැලසීම පිළිබඳව සොයා බැලීම මෙන්ම ජාතියේ ජීවය බඳු ළමා පරපුරෙහි සුරක්ෂිතතාවය තහවුරු කිරීම උදෙසා ළමා ශ්‍රමය පිටුදැකීමේ කාර්යය උදෙසා ක්‍රියා කිරීමද කම්කරු දෙපාර්තමේන්තුව සතු වගකීමකි.

ඒ අනුව, රැකියාවන්හි නියුතු කාන්තාවන්ගේ සුරක්ෂිතභාවය උදෙසා කම්කරු දෙපාර්තමේන්තුව 2017 වර්ෂය තුලදී පහත ක්‍රියාකාරකම් සිදුකර ඇත.

- ✓ ජාත්‍යන්තර කාන්තා දිනය කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපයේ සේවයේ නියුතු කාන්තා සේවිකාවන් 400 දෙනෙකුගේ පමණ සහභාගීත්වයෙන් උපදේශන වැඩමුළුවක ආකාරයෙන් පවත්වන ලදී.
- ✓ වැඩකරන කාන්තාවන් දැනුවත් කිරීමේ අරමුණින් වැවිලි අංශයේ සේවිකාවන් සඳහා සම්මන්ත්‍රණ 03ක්ද කර්මාන්තශාලා දැනුවත් කිරීමේ සේවාස්ථ සම්මන්ත්‍රණ 09ක්ද ආයෝජන ප්‍රවර්ධන කලාපයන්හි සේවිකාවන් උදෙසා කටුනායක, බියගම සහ කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාප තුල මනෝවිද්‍යා උපදේශන / යෝග වැඩසටහන් 02ක් සහ සමාජ රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 04ක්ද පවත්වන ලදී.
- ✓ ජාතික මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව වෙළඳ කලාප නේවාසික සේවක සේවිකාවන් දැනුවත් කිරීමේ අරමුණින් නිදහස් වෙළඳ කලාපීය නේවාසික සේවක සේවිකාවන් දැනුවත් කිරීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 08ක් පවත්වන ලදී.
- ✓ කුඩා වැවිලි හා කෘෂි අංශයේ සේවය කරනු ලබන කාන්තාවන්ට අමතර ආදායම් මාර්ගයක් ලබා ගැනීමට අත දීමක් වශයෙන් ස්වයංරැකියා පුහුණු වැඩසටහන් 04ක් පවත්වන ලදී.
- ✓ කාන්තාවන් පෞද්ගලික අංශයේ රැකියාවන්හි නිරතවන අවස්ථාවේදී ඔවුන්ගේ දරුවන්ගේ ආරක්ෂාව සුරක්ෂිත කිරීමේ පරමාර්ථයෙන් යුතුව දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රවර්ධන වැඩසටහන් 19ක් පවත්වන ලදී. පෞද්ගලික අංශයේ කාන්තාවන්ගේ ශ්‍රම දායකත්වය වර්ධනය කිරීම මෙමගින් අපේක්ෂා කරන ලදී.
- ✓ ආයතනවල කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අවසර ලබාදීම සඳහා ඒකාබද්ධ පරීක්ෂණ 62ක් සිදු කරන ලදී.

ජාතියේ ජීවයබඳු ළමා පරපුරෙහි අයිතීන් සුරක්ෂිත කිරීමේ වගකීම උදෙසා කම්කරු දෙපාර්තමේන්තුව 2017 වර්ෂය තුලදී පහත ක්‍රියාකාරකම් සිදුකර ඇත.

- ✓ 2017 ඔක්තෝබර් මස 01 වන දිනට යෙදෙන ලෝක ළමා දිනය සැමරීම වෙනුවෙන් වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාසල් 10 ක ළමුන් 50 දෙනෙකු සහභාගී කරගනිමින් දැනුම මිනුම, ගායන තරඟ, අභියෝගතා තරඟ, සහය දිවීමේ තරඟ ආදිය පවත්වා ජයග්‍රාහී දරු දැරියන්ට තිළිණ හා සහතිකපත් ප්‍රදානය කිරීමද, සහභාගී වූ සියලු පාසල් ළමුන් සඳහා ත්‍යාග ප්‍රදානය කිරීමද සිදු කරන ලදී.
- ✓ මෙම වර්ෂයේදී ලෝක ළමා ශ්‍රම විරෝධී දින වෙනුවෙන් සැමරුම් උත්සවයක් සංවිධානය නොකල අතර, එම දිනයට සමගාමීව අඩු අදායම්ලාභී පවුල්වල අනතුරුදායක රැකියාවල

නිරතවීමේ අවදානම සහිත පාසල් දරුවන්හට ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිටු දැකීම පිළිබඳ පණිවුඩය මුද්‍රණය කරන ලද පාසල් අභ්‍යාස පොත් බෙදා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

- ✓ ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය ශුන්‍යත්වයට පත් කිරීමේ වැඩසටහන යටතේ අවුරුදු 18ට අඩු තරුණ අය සේවයේ යෙදීම පාලනය කිරීම සඳහා සහ විවිධ සමාජයීය හා ආර්ථික අපහසුතාමත පාසල් හැරගොස් සේවයේ යෙදීම වැළැක්වීමේ අරමුණින් පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 29ක් පවත්වන ලදී.
- ✓ ළමා ශ්‍රමය සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමේදී කම්කරු නිලධාරීන් වෙත සහයෝගය ලබා දෙන පොලිස් ළමා හා කාන්තා අංශ නිලධාරීන්, පරිවාස නිලධාරීන්, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රාදේශීය නිලධාරීන්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීම සඳහා විශේෂ වැඩමුළු 02ක් පවත්වන ලදී.
- ✓ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය යටතේ රත්නපුර දිස්ත්‍රික්කය ආවරණයවන පරිදි ර/ශාන්ත ජෝකිම් විද්‍යාලය, කහවත්ත දෙමළ විද්‍යාලය, ර/පත්බේරිය නාරද මධ්‍ය මහා විද්‍යාලය යන පාසල්හි ජංගම වැඩසටහන් 03ක් පවත්වන ලදී.
- ✓ ළමා ශ්‍රමය පිළිබඳ සමීක්ෂණ වාර්තාව (2015/2016) එළි දැක්වීමේ වැඩසටහන සහ මාධ්‍ය දැනුවත් කිරීමේ විශේෂ මාධ්‍ය සාකච්ඡාව වැල්ලවත්ත ග්ලොබල් ටවර් හෝටලයේදී පවත්වන ලදී. මෙම අවස්ථාව සඳහා කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශ ගරු අමාත්‍යතුමන්, අමාත්‍යාංශ ලේකම්තුමන්, කම්කරු කොමසාරිස් ජනරාල්තුමන්, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිලධාරීන්, කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, ජන හා සංඛ්‍යාලේඛන අංශයේ නිලධාරීන් හා මාධ්‍ය නිලධාරීන් රැසක් සහභාගී විය.

## විශේෂ විමර්ෂණ කටයුතු

සාමාන්‍ය පරිදි සිදු කෙරෙන කම්කරු පරීක්ෂණ සහ පැමිණිලි පරීක්ෂණවලට අමතරව කම්කරු අණ පනත් හා විධිවිධාන කඩිනමින් ක්‍රියාවට නැංවීම සඳහා හදිසි පරීක්ෂණ හා විශේෂ විමර්ශන රාජකාරී කටයුතු වල යෙදීම සඳහා දෙපාර්තමේන්තුවේ විශේෂ අංශයක් පිහිටුවා ඇත.

ඒ අනුව, 2017 වර්ෂයේදී පැමිණිලි පරීක්ෂණ 420 ක් සිදු කර ඇති අතර ගණනය කරන ලද හිඟ මුදල් වටිනාකම රු 198,184,397.89 ක් වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව, මහජන පෙත්සම් කාරක සභාව, ජනාධිපති කාර්යාලය, අගමැති කාර්යාලය ආදී ආයතන වෙතින් ලැබෙන පැමිණිලි පරීක්ෂණ 52ක් සිදුකර ඇත. සේවකයන් 100ට වැඩි ආයතන ( තෝරාගත් අංශ සඳහා) 16ක් පරීක්ෂා කර ඇත.

## පරිපාලන කටයුතු

### භෞතික සම්පත් පරිපාලනය

කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට කාර්යක්ෂම ලෙස රාජකාරි කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් ක්‍රමවත් ලෙස සකස් කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් වේ.

ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව සතු භූමියෙහි 'මෙහෙවර පියස' ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදු වෙමින් පවතී. මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වෙනුවෙන් 2017 වර්ෂය තුල දැරූ වියදම රු. මිලියන 2133.75 කි. 2017.12.31 දිනට එහි භෞතික ප්‍රගතිය 67.92%කි.

අවිස්සාවේල්ල සහ මීගමුව කම්කරු කාර්යාලවල ඉදිකිරීම් කටයුතු වර්ෂය තුලදී නිම කර කාර්යාල කටයුතු පවත්වාගෙන යනු ලැබේ.







පුත්තලම දිස්ත්‍රික් කම්කරු කාර්යාලය

අම්බලන්ගොඩ උප කම්කරු කාර්යාලය





කම්කරු කාර්යාලවල සිදු කල ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය පහත පරිදි වේ.

| වැඩසටහන /ක්‍රියාකාරකම | 2017.12.31 දිනට ප්‍රගතිය | |
|---|---|---|
| | භෞතික | මූල්‍ය (රු. මිලියන) |
| මෙහෙවර පියස | 67.92% | 2133.80 |
| අවිස්සාවේල්ල | 100% | - |
| මීගමුව | 100% | - |
| පොළොන්නරුව | අදියර 03 - 100% | - |
| කුරුණෑගල | අදියර 02 - 30% | 61 |
| පුත්තලම | අදියර 03 - 98% | 15 |
| අම්බලන්ගොඩ | අදියර 02 - 20% | 21 |
| අනුරාධපුර | අදියර 02 - 100% | 3.447 |
| මහියංගනය | අදියර 02 - 50% | 21 |
| රත්නපුර | 3% | 24.99 |
| බදුල්ල | 2% | 24.79 |
| හැටන් | 2% | 14.98 |
| නාඋල | 2% | 0.014 |
| වව්නියාව | 2% | 0.023 |

**මානව සම්පත් කළමණාකරනය**

කාර්ය මණ්ඩලය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම තුළින් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම පහසු වේ. ඒ සඳහා ඉටු කරනලද කාර්යයන් පහත පරිදි වේ.

- තාක්ෂණික සේවයේ බඳවා ගැනීමේ පරිපාටිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීම
- විද්‍යාත්මක සේවයේ පර්යේෂණ නිලධාරී බඳවා ගැනීම් පරිපාටිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කිරීම
- කම්කරු කොමසාරිස් (වෘත්තීය සෞඛ්‍ය) බඳවා ගැනීමේ පරිපාටිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කිරීම
- පුරප්පාඩු සඳහා නීති නිලධාරින් 04ක්, කම්කරු නිලධාරීන් 179ක්, ලඝුලේඛකයින් 05ක්, රියදුරන් 17ක්, කාර්යාල කාර්ය සහයකයින් 20ක්, සහ විදුලි කාර්මිකයෙකු බඳවා ගැනීමට අදාල කටයුතු සිදු කිරීම
- මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරින්ගේ කාර්යසාධන ගෙන්වා ගැනීම.(1A,1B,2,3,17)
- නිල ඇඳුම් දීමනා ලබා දීම ( මුරකරු සේවය,රියදුරු,කා.කා.සේ. අදාල සේවකයින් හට)
- වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම.
- විශ්‍රාම වැටුප් ගොනු සකස් කිරීම.

- සහකාර කම්කරු කොමසාරිස්වරු, ඉංජිනේරු සේවය, කම්කරු නිලධාරීන්, මානව සම්පත් සංවර්ධන නිලධාරින්, රියදුරන් සහ කාර්යාල සේවක සේවය (කා.සේ.සේ.) සඳහා කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම.
- මානව හිමිකම් කොමිෂන් සභාව, මහජන පෙත්සම් කාරක සභාව වෙත වාර්තා යැවීම.
- වසර මැද කාර්ය සාධන (වාර්ෂික)ගෙන්වා ගැනීම.
- වත්කම් බැරකම් වාර්තා ගෙන්වා ගැනීම.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව වැටුප් පරිවර්තනය කිරීම
- දෙපාර්තමේන්තු ප්‍රතිව්‍යුහගතකරණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාල මූලික කටයුතු සිදු කිරීම

**පුස්තකාලය හා තොරතුරු සේවාව**

සේවා සේවක ප්‍රජාවගේ අභිවර්ධනයට අදාලව හඳුනාගත් අවශ්‍යතාවයන් හා ගැලපෙන පරිදි විෂයානුබද්ධ තොරතුරු රැස්කිරීමටත්, අවශ්‍යතා අනුව එම දැනුම විස්තීරණය කිරීමට මග පෑදීමටත්, දෙපාර්තමේන්තුවේ සේවකයන්ට සහ පොදු මහජනතාවට කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීමටත් කම්කරු දෙපාර්තමේන්තුව විසින් පුස්තකාලයක් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව, පාඨකයන්ගේ දැනුම, අවබෝධය සහ රසාස්වාදය උදෙසා පොත් හා සඟරා 173ක් වර්ෂය තුලදී අළුතින් මිලදී ගැනීමට කටයුතු කර ඇත.

එසේම කම්කරු දෙපාර්තමේන්තුව විසින් කම්කරු කෞතුකාගාරයක් පවත්වාගෙන යනු ලබන අතර එහි ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ ආරම්භයේ සිට විකාශය වූ අයුරු ප්‍රදර්ශනය කිරීමත් කම්කරු ක්ෂේත්‍රය හා බැඳී පවතින පැරණි අණ පනත් හා කම්කරු ක්ෂේත්‍රය හා බැඳී පවතින ලේඛනයන් සංරක්ෂණය කිරීමත් සිදු කරනු ලැබේ.



කම්කරු කෞතුකාගාරයේ ඡායාරූපයක්

### ප්‍රගති අධීක්ෂණ සහ සමාලෝචන කටයුතු


කම්කරු දෙපාර්තමේන්තුවේ සියළුම අංශ සඳහා සහ සියළුම දිස්ත්‍රික් / උප කම්කරු කාර්යාල සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස්කර එම සැලසුම්හි ප්‍රගතිය මාසිකව සහ කාර්තුගතව අධීක්ෂණය කර ඇත.

2017කම්කරු කාර්යාලවල ප්‍රගතිය අධීක්ෂණයකර ප්‍රගති සමාලෝචන කටයුතු සඳහා **2017** වසරේදී කලාප මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් 06ක් පවත්වා ඇත. එසේම ප්‍රාදේශීය කාර්යාල භාර නිලධාරීන්ගේ සම්මන්ත්‍රණ 03ක් පවත්වා ඇත.

කම්කරු නිලධාරින් විසින් සිදු කරනු ලබන කම්කරු පරීක්ෂණ පිළිබඳ තොරතුරු සහ කාර්යාල වලට ලැබෙන පැමිණිලි, නඩු පිළිබඳ තොරතුරු පරිගණක ගත කිරීම මගින් විධිමත් දත්ත පද්ධතියක් ඇති කිරීම සඳහා Labour Inspection System Application හෙවත් LISA වැඩසටහන යාවත්කාලීනව පවත්වාගෙන යාමද මෙම වර්ෂයේදී සිදුකර ඇත. දිස්ත්‍රික් කාර්යාලයන්හි LISA වැඩසටහන භාවිතාකර රාජකාරි සිදුකරන ආකාරය පරීක්ෂාකර අන්තර්ජාල ගැටළු හා පරිගණක දෝෂ විසඳීම, LISA වැඩසටහන සම්බන්ධ විෂය ගැටළු විසඳීම, පෙත්සම් ලේඛනය සම්බන්ධයෙන් සහ නඩු ලේඛනය පවත්වා ගැනීම සම්බන්ධයෙන් උපදෙස් අදාල කාර්යාල වෙත ලබා දීමද සිදුකර ඇත.

නිලධාරීන්ගේ කාර්යසාධනය ඉහල නැංවීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් සංවිධානයකර පවත්වා ඇත.

| වැඩසටහන | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| මාණ්ඩලික නිලධාරි පුහුණු වැඩසටහන් | 6 |
| කළමණාකරන සහකාර නිලධාරි පුහුණු වැඩසටහන් | 18 |
| පරිගණක පුහුණු වැඩසටහන් | 14 |
| පශ්චාත් උපාධි සහ ඩිප්ලෝමා පාඨමාලා සඳහා යොමු කිරීම් | 80 |
| බාහිර පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම් | 24 |
| වෙනත් පුහුණු වැඩසටහන් | 5 |
| විදේශ පුහුණු වැඩසටහන් | 6 |
| බඳවා ගන්නා ලද නවක කම්කරු නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන් | 1 |

වර්ෂය තුල පැවැත්වූ පුහුණු වැඩසටහන් කිහිපයක සේයා රූ

## මූල්‍ය කළමනාකරණය

2017 වර්ෂය තුලදී දෙපාර්තමේන්තුවට සිය මූල්‍ය සම්පත් කාර්යක්ෂමව, ඵලදායීව හා පිරිමැසුම්දායීව මෙහෙයවීමට හැකියාව ලැබී ඇත.

මූල්‍ය කළමනාකරණය උදෙසා පහත කටයුතු සිදුකරන ලදී.

- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන සැලැස්ම සැකසීම හා එය ක්‍රියාත්මක කිරීම
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ලබා ගන්නා ලද භාණ්ඩ හා සේවා නිසි පරිදි බෙදාහැරීම
- උප කාර්යාල සඳහා අග්‍රිම නිකුත් කිරීම හා එම කාර්යාලවල මූල්‍ය අධීක්ෂණය
- මාසික, අර්ධ වාර්ෂික හා වාර්ෂික ගිණුම් වාර්තා සැකසීම හා අදාල පාර්ශවයන් වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම
- බාහිර පාර්ශවයන්ගෙන් ලැබෙන සියළුම ලැබීම් හා ගෙවීම් කටයුතු නීතිරීති ප්‍රකාරව මෙහෙයවීම
- දෙපාර්තමෙන්තුව සතු ප්‍රාග්ධන වත්කම් සමීක්ෂණය හා අපහරණ කටයුතු
- දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පඩිනඩි, ණය අත්තිකාරම් හා දිමනා ගෙවීම

2017 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් 31 දින දක්වා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රගතිය

| වැඩසටහන | වියදම් වර්ගය | **2017 වර්ෂය සඳහා ප්‍රතිපාදනය (රු)** | **2017 දෙසැම්බර් 31 දිනට වියදම (රු)** |
|---|---|---|---|
| 221 | පුනරාවර්තන | 1,505,256,000 | 1,451,795,889.23 |
| | මූලධන | 3,607,300,000 | 2,503,986,516.61 |

**ප්‍රාග්ධන වියදම් වර්ගීකරණය**

| වියදම් වර්ගය | **2017** අයවැය ප්‍රතිපාදනය | **2017** සත්‍ය වියදම | සත්‍ය වියදම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරිම | 57,400,000.00 | 48,032,220.55 | 84% |
| ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම | 3,526,250,000.00 | 2,387,686,957.42 | 68% |

**පුනරාවර්තන වියදම් වර්ගීකරණය**

| වියදම් වර්ගය | **2017** අයවැය ප්‍රතිපාදනය | **2017** සත්‍ය වියදම | සත්‍ය වියදම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 1,174,700,000.00 | 1,134,858,706.99 | 97% |
| ගමන් වියදම් | 61,700,000.00 | 60,568,532.90 | 98% |
| සැපයීම් | 55,291,000.00 | 48,684,156.32 | 88% |
| නඩත්තු සේවා | 13,143,000.00 | 11,868,679.55 | 90% |
| ඉදිකිරීම් සේවා | 1,770,000.00 | 1,415,213.74 | 80% |
| වෙනත් සේවා | 174,064,000.00 | 169,914,384.92 | 98% |
| මාරු කිරීම් | 24,562,000.00 | 24,462,898.81 | 100% |
| වෙනත් | 26,000.00 | 23,316.00 | 90% |
| එකතුව | 1,505,256,000.00 | 1,451,795,889.23 | 96% |

## කම්කරු ක්ෂේත්‍රයට සම්බන්ධ සංඛ්‍යාලේඛන ප්‍රකාශන කටයුතු

ශ්‍රී ලංකාවේ කම්කරු අංශයේ කාලීන සංකීර්ණ වෙනස්වීම් අධ්‍යයනය කරමින් වඩා නිවැරදි තොරතුරු හා සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා ඒ තුළින් අනාගත පුරෝකථන ඉදිරිපත් කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ කටයුතු කරනු ලැබේ. ඒ අනුව 2017 වර්ෂයේදී පහත කටයුතු සිදුකර ඇත.

- වාර්ෂික රැකිරක්ෂා සමීක්ෂණ වාර්තාව 2016

  මුද්‍රණයෙන් සහ වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කර ඇත

- වාර්ෂික රැකිරක්ෂා සමීක්ෂණය 2017

  2017 සමීක්ෂණයේ දත්ත පරිගණක ගතකිරීම සිදුකරමින් පවතී

- කම්කරු සංඛ්‍යාති වාර්ෂික ප්‍රකාශනය 2016

  මුද්‍රණයෙන් සහ වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කිරීම සඳහා පිටපත සකස් කර ඇත

- ශ්‍රී ලංකා සේවක සගරාව කාර්තුමය ප්‍රකාශනය 2017

  ප්‍රකාශනය සඳහා වෙනත් ආයතන වලින් දත්ත එක්රැස් කර ලබා දී ඇත

- සාමාන්‍ය ඉපැයීම් සහ වැඩකල පැය ගණන පිළිබඳ සමීක්ෂණ වාර්තාව 2016

  අවසන් වාර්තාව ප්‍රකාශයට පත් කර ඇත

- සාමාන්‍ය ඉපැයීම් සහ වැඩකල පැය ගණන පිළිබඳ සමීක්ෂණය 2017

  2017 මාර්තු සමීක්ෂණය අවසන් කර ඇත සැප්තැම්බර් සමීක්ෂණය අවසන් කර දත්ත සංස්කරණය කරමින් පවතී

- අවම වැටුප් අනුපාත දර්ශකාංකය ගණනය කිරීම

  අදාල කාලය සඳහා පඩි පාලක සභා අනුව මාසික අවම වැටුප් දර්ශකාංකය ගණනය කිරීම ඔක්තෝම්බර් මාසය දක්වා අවසන් කර ඇත

- සේවක අර්ථසාධක අරමුදල් නව ලියාපදිංචි කිරීම් පරිගණක ගත කිරීම

  මේ වනවිට ලැබී ඇති දත්ත පරිගණක ගතකර ඇත

## තොරතුරු තාක්ෂණික කටයුතු

ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාල මූලික කටයුතු 2017 වර්ෂයේදී ආරම්භ කර ඇත. එසේම දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා සැපයෙන මහජන සේවාවන් ප්‍රවර්ධනය කිරීමටද කටයුතුකර ඇත.



කම්කරු දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධාන නිලධාරීන්ගේ නාම ලේඛනය (2017.12.31 දිනට)

| | අංශය | තනතුර | නම |
|---|---|---|---|
| 1 | කම්කරු කොමසාරිස් ජනරාල් | | ඒ. විමලවීර මයා |
| 2 | අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (පරිපාලන) | | සී. එන්. විතානාච්චි මයා |
| 3 | අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (දෙපාර්තමේන්තු) | | පී. එස්. පතිරත්න මයා |
| 4 | අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (ඉංජිනේරු) | | ඩබ්. අයි. සී. ඩී. ආර්. ප්‍රනාන්දු මයා |
| 5 | පාලන අංශය | කම්කරු කොමසාරිස් | ජී. ඩී. ඩබ්. ජයවර්ධන මයා |
| 6 | කාර්මික සම්බන්ධතා අංශය | කම්කරු කොමසාරිස් | කේ. ඩී. මනෝජ් ප්‍රියන්ත මයා |
| 7 | සේවක අර්ථසාධක අරමුදල් අංශය | කම්කරු කොමසාරිස් | ඩී. පී. කේ. ආර්. වීරකෝන් මයා |
| 8 | නීති ක්‍රියා අංශය | කම්කරු කොමසාරිස් | ඩී. එම්. කරුණාරත්න මයා |
| 8 | සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය | කම්කරු කොමසාරිස් | ඩී. පී. කේ. ආර්. වීරකෝන් මයා (වැ.බ.) |
| 9 | විශේෂ විමර්ශන අංශය | කම්කරු කොමසාරිස් | පී. ඩබ්. එම්. ජී. වික්‍රමසිංහ මයා |
| 10 | ශ්‍රම ප්‍රමිති අංශය | කම්කරු කොමසාරිස් | ජනක පරණමාන මයා |
| 11 | මානව සම්පත් සංවර්ධන අංශය (සමාජ කතිකා හා වැඩපොල සහයෝගිතා ඒකකය) | කම්කරු කොමසාරිස් | එල්. ඩී. චිත්‍රා ජයසීලි මිය |
| 12 | කාන්තා හා ළමා කටයුතු අංශය | කම්කරු කොමසාරිස් | පී. මහාදේවා මයා |
| 13 | කර්මාන්තමය සුරක්ෂිතතා අංශය | කම්කරු කොමසාරිස් | ඩබ්. අයි. සී. ඩී. ආර්. ප්‍රනාන්දු මයා |
| 14 | මුදල් අංශය | ප්‍රධාන ගණකාධිකාරී | ඩී. කේ. ඩී. පී. ලක්මාලි මෙය |
| 15 | අභ්‍යන්තර විගණන අංශය | ප්‍රධාන අභ්‍යන්තර විගණක | අයි. එල්. සෝමසිරි මයා |
| 16 | වෘත්තීය ස්වස්ථතා අංශය | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | වෛද්‍ය වජිර එම්. පලිපාන මයා |
| 17 | සංඛ්‍යාලේඛන අංශය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) | ඩී. බී. විරවර්ණ මයා |
| 18 | ඉදිකිරීම් හා ගොඩනැගිලි නඩත්තු අංශය | ඉංජිනේරු (ගොඩනැගිලි)<br>ඉංජිනේරු (සිවිල්)<br>ඉංජිනේරු (විදුලි) | ආර්. ජේ. අබේසිරිවර්ධන මයා<br>ජී. එච්. ආර්.එස්. ඊ. සිල්වා මිය<br>එච්. එල්. එල්. ධම්මිකා මිය |
| 19 | පුස්තකාලය | පුස්තකාලයාධිපති | එච්. රේණුකා කුමාරි ජයවර්ධන මිය |

කලාප කම්කරු කාර්යාල

| | කලාප කම්කරු කාර්යාලය | 2017/12/31 දිනට සේවයේ නියුතු කලාපය භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයාගේ නම |
|---|---|---|
| 1 | බටහිර 1 | එල්.ටී.ජී.ඩී. දර්ශන මයා (රාජකාරි ඉටුකරන) |
| 2 | බටහිර 11 | ආර්.ඩබ්.එම්. පොඩිනිලමේ මයා (රාජකාරි ඉටුකරන) |
| 3 | බටහිර 111 | එන්.එම්.වී.තුෂාරි මිය (රාජකාරි ඉටුකරන) |
| 4 | සබරගමුව | ජී.පී.එස්. ලියනගේ මයා (රාජකාරි ආවරණ) |
| 5 | වයඹ | ඩබ්.එම්.එස්. බණ්ඩාර මයා (රාජකාරි ඉටුකරන) |
| 6 | මධ්‍යම | ජේ.කේ. බෝගහවත්ත මිය (රාජකාරි ඉටුකරන) |
| 7 | දකුණ | ඩබ්.ඩබ්. පුංචිහේවා මයා (රාජකාරි ඉටුකරන) |
| 8 | ඌව | ආර්.එන්. වික්‍රමආරච්චි මිය (රාජකාරි ආවරණ) |
| 9 | උතුරු මැද | ඩී.එම්.ජී. වීරසිංහ මයා (රාජකාරි ඉටුකරන) |
| 10 | උතුර | එන්. ජෙගදීස්වරන් මිය (වැඩ බලන) |
| 11 | නැගෙනහිර | කේ.එම්.ආර්.එල්. ජයතිලක මයා (රාජකාරි ඉටුකරන) |

දිස්ත්‍රික් කම්කරු කාර්යාල

| | දිස්ත්‍රික් කම්කරු කාර්යාලය | 2017/12/31 දිනට සේවයේ නියුතු දිස්ත්‍රික් කම්කරු කාර්යාලය භාර සහකාර කම්කරු කොමසාරිස්වරුන්ගේ නම |
|---|---|---|
| 1 | මැද කොළඹ | ඩබ්.එම්.ඩී.ආර්. වීරකෝන් මයා |
| 2 | දකුණු කොළඹ | ආර්.පී.අයි. උදයංගනී මෙය |
| 3 | බටහිර කොළඹ | පී.බී.සී. පේමබන්දු මිය |
| 4 | නැගෙනහිර කොළඹ | එන්.ආර්. රණවක මිය |
| 5 | කළුතර | ඊ.සී.එස්. විරසිංහ මිය |
| 6 | පානදුර | එල්.එම්. හේවාවිතාන මිය |
| 7 | මතුගම | කේ.ඒ. ප්‍රේමසිරි මයා |
| 8 | මහරගම | ඩී.එල්. දයානන්ද මයා |
| 9 | උතුරු කොළඹ | ඒ.ඩී.කේ. මිලංග විරක්කොඩි මයා |
| 10 | ගම්පහ | බී.ඒ.ජේ.එම්. බාලචන්ද්‍ර මයා |
| 11 | ජා ඇල | බී.ඒ. මහින්ද මයා |
| 12 | මීගමුව | සී.ජී.එච්. සනත්ලංකා මයා |
| 13 | රත්නපුර | ආර්.ජී.ජේ.බී. ගුණතිලක මයා |
| 14 | අවිස්සාවේල්ල | පී.ජී.ආර්. චන්ද්‍රවංශ මයා |
| 15 | පැල්මඩුල්ල | ජී.පී.එස්. ලියනගේ මයා |
| 16 | කෑගල්ල | කේ.ජී.ජේ.බී. කුරුකොහොතැන්න මයා |
| 17 | කුරුණෑගල | ඒ.ඩී.එස්.ආර්. විජයසිංහ මයා |
| 18 | කුලියාපිටිය | එච්.පී.ඩී.එන්.කේ. ජයසේකර මයා |
| 19 | හලාවත | ඒ.එම්.එස්.. චන්ද්‍රකා මිය |
| 20 | පුත්තලම | එම්.ඒ.ඒ.ඩී.පී.වී. මුණසිංහ මයා |
| 21 | මහව | ආර්.එම්.පී. රත්නායක මිය |
| 22 | වෙන්නප්පුව | කේ.එල්.ඩී.වී. රත්නකුමාරි මිය |
| 23 | නුවර උතුර | ඒ.ආර්. හේවාපතිරණ මයා |
| 24 | නුවර දකුණ | බී.ඒ.එස්.පී.කේ. බාලසූරිය මයා |
| 25 | මාතලේ | ජේ.එම්.පී.කරුණාරත්න මයා |
| 26 | හැටන් | ඩබ්.ඩබ්.එස්.බී. මඩුගල්ල මයා |
| 27 | නුවර එළිය | ඊ.එම්.පී. ඒකනායක මයා |
| 28 | ගාල්ල | එන්.පී. මානගේ මිය |
| 29 | මාතර | ඩී.එච්.ටී. දේශප්‍රිය මයා |
| 30 | හම්බන්තොට | අයි.එල්.වික්‍රමනායක මයා |

| | | |
|---|---|---|
| 31 | බදුල්ල | ඩී.එම්. ගාමිණී මයා (වැඩ බලන) |
| 32 | මොණරාගල | ඩී.එම්. ගාමිණී මයා |
| 33 | හපුතලේ | ආර්.එන්. වික්‍රමආරච්චි මිය |
| 34 | අනුරාධපුර | ආර්.එම්.අයි.සී.කේ. රත්නායක මිය |
| 35 | පොළොන්නරුව | කේ.එම්.ආර්.එල්.ජයතිලක මයා |
| 36 | යාපනය | එන්. ජේකදිස්වරන් මිය |
| 37 | වවුනියාව | එස්. සිවරංජනී මිය |
| 38 | ත්‍රිකුණාමලය | ඒ.එම්.බණ්ඩාරනායක මයා (වැඩ බලන) |
| 39 | අම්පාර | එම්.එස්.එම්. අන්සාර් මයා |
| 40 | මඩකලපුව | ඒ. ගෝකුල රන්ජන් (රාජකාරි ආවරණ) |

උප කම්කරු කාර්යාල

| | උප කම්කරු කාර්යාලය | 2017/12/31 දිනට සේවයේ නියුතු උප කම්කරු කාර්යාලය භාර ජොෂ්ඨ කම්කරු නිලධාරියාගේ නම |
|---|---|---|
| 1 | යටියන්තොට | එල්.එන්.කේ.කේ.එස්. දයාරත්න මිය |
| 2 | ඇඹිලිපිටිය | ඒ.ජී.ඒ. ශ්‍රියානි මිය |
| 3 | වරකපොල | ජේ.ඒ.සී.එන්. ජයකොඩි මයා |
| 4 | ගම්පොල | බී.එච්.එම්.ඩබ්.කේ. බමුණුගෝන්ද්‍ර මිය |
| 5 | නාඋල | එම්.කේ.එස්. සිරිවර්ධන මයා |
| 6 | නාවලපිටිය | වී.ජී.කේ.අයි. පෙරේරා මයා |
| 7 | අම්බලන්ගොඩ | ටී.එච්.එස්.ඒ. සිල්වා මිය |
| 8 | ඇල්පිටිය | ඒ.පී.ඒ. ප්‍රියන්ත මයා |
| 9 | මොරවක | කේ..ඩබ්. අතපත්තු මයා |
| 10 | බෙලිඅත්ත | අයි.ආර්. වෙල්ලප්පිලි මයා |
| 11 | මහියංගනය | ඒ.එම්.ජේ.කේ. අත්තනායක මයා |
| 12 | මැදවච්චිය | සී.එම්.එම්. චන්ද්‍රසේකර මයා |
| 13 | කිළිනොච්චිය | පී. ප්‍රදීපන් මයා |
| 14 | මුලතිව් | පී. ප්‍රදීපන් මයා (වැඩ බලන) |
| 15 | මන්නාරම | අරුද්සෙල්වම් (වැඩ බලන) |
| 16 | කන්තලේ | එස්.එම්. නසාර් මයා |
| 17 | කල්මුණේ | එම්.එස්. හුසේන මයා |

දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු කලාප කම්කරු කාර්යාල

| | දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය | 2017/12/31 දිනට සේවයේ නියුතු දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය භාර දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු වරයාගේ නම |
|---|---|---|
| 1 | අනුරාධපුර | එස්.ජී. දිසානායක මයා |
| 2 | බදුල්ල | එච්.එම්.ඒ.සී. නවරත්න මයා (කර්.පරී. ඉංජිනේරු) |
| 3 | කොළඹ | ර්. අබේසිරිවර්ධන මයා (විශේ. කර්.පරී. ඉංජිනේරු) |
| 4 | ගාල්ල | එම්.එච්.අයි. ලක්මාලි මෙය |
| 5 | ගම්පහ | ආර්.ජේ. අබේසිරිවර්ධන මයා |
| 6 | යාපනය | වී. සුසීන්ද්‍රන් මයා |
| 7 | නුවර | කේ.එම්.යූ.බී. කුලසේකර මයා |
| 8 | කළුතර | ටී.ජී.ආර්.කේ. හේමචන්ද්‍ර මයා |
| 9 | කුරුණෑගල | එම්.ආර්. විජේතුංග මයා |
| 10 | රත්නපුර | බඩ්.එම්.ආර්.සී.ඒ. විජේකෝන් මෙය |

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල වෙනස්වීම් 2017.12.31 දිනට

| | |
|---|---|
| වර්ෂය ආරම්භයේ සිට මුළු සේවක සංඛ්‍යාව | 2400 |
| දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද නව බඳවා ගැනීම් සහ ඒකාබද්ධ සේවයේ නව පත්වීම් ලෙස දෙපාර්තමේන්තුවට පැමිණීම් | 253 |
| ස්ථාන මාරු, විශ්‍රාම යාම් සහ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයෙන් ඉවත් වීම් | (158) |
| වර්ෂය අවසානයේ මුළු සේවක සංඛ්‍යාව | 2495 |

## 2017.12.31 දිනට කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය

| | තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | අනියම් ආදේශක | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ** | | | | | |
| 1. | කම්කරු කොමසාරිස් ජනරාල් | 1 | 1 | | 0 |
| 2. | අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (ශ්‍රී. ලං. ප. සේ) | 1 | 1 | | 0 |
| 3. | අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (දෙපා.) | 1 | 0 | | 1 |
| 4. | අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (ඉංජිනේරු) | 1 | 1 | | 0 |
| 5. | වෛද්‍ය නිලධාරි | 4 | | | 2 |
| | වෛද්‍ය නිලධාරි | | 1 | | |
| | වෛද්‍ය නිලධාරි (පර්යේෂණ) | | 1 | | |
| 6. | කම්කරු කොමසාරිස් (ශ්‍රී.ලං.ප.සේ.) (විදේශ දූත මණ්ඩලවල නිලධාරීන් දෙදෙනෙකු සේවය කරයි) | 6 | 8 | | -2 |
| 7. | කම්කරු කොමසාරිස් (දෙපා.) | 2 | 0 | | 2 |
| 8. | කම්කරු කොමසාරිස් (කර්මාන්තමය සුරක්ෂිතතා ) හා ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (ශ්‍රී.ලං.ඉ.සේ) | 1 | 0 | | 1 |
| 9. | කම්කරු කොමසාරිස් (ශ්‍රී.ලං.වි.සේ.) / (ශ්‍රී.ලං.වෛ.සේ) | 1 | 0 | | 1 |
| 10. | ප්‍රධාන ගණකාධිකාරි | 1 | 1 | | 0 |
| 11. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | | 0 |
| 12. | ප්‍රධාන නීති නිලධාරී සහ කම්කරු කොමසාරිස් (නීති ක්‍රියා) | 1 | 0 | | 1 |

| | තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | අනියම් ආදේශක | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| 13. | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් නියෝජ්‍ය ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (ශ්‍රී.ලං.ඉ.සේ) | 1 | 0 | | 1 |
| 14. | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (ශ්‍රී.ලං.ප.සේ.) | 15 | 0 | | 15 |
| 15. | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (දෙපා) | 9 | 3 | | 6 |
| 16. | නි. කම්. කො. හා විශේෂඥ පර්යේෂණ නිලධාරි (ශ්‍රී.ලං.වි.සේ.) | 1 | 0 | | 1 |
| 17. | ගණකාධිකාරි | 5 | 5 | | 0 |
| 18. | සහකාර කම්කරු කොමසාරිස් (ශ්‍රී.ලං.ප.සේ.) | 41 | 29 | | 12 |
| 19. | සහකාර කම්කරු කොමසාරිස් (දෙපා) | 63 | 58 | | 5 |
| 20. | නීති නිලධාරි | 14 | 12 | | 2 |
| 21. | සහකාර අධ්‍යක්ෂ - සැලසුම් | 1 | 1 | | 0 |
| 22. | විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (විදුලි සුරක්ෂිතතා) | 1 | 1 | | 0 |
| 23. | විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (අධි අවධානම් යන්ත්‍ර සුරක්ෂිතතා) | 1 | 1 | | 0 |
| 24. | විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (ඉදිකිරීම් සුරක්ෂිතතා) | 1 | 1 | | 0 |
| 25. | විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (රසායනික / යාන්ත්‍රික සුරක්ෂිතතා) | 1 | 1 | | 0 |
| 26. | විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු | 3 | 1 | | 2 |
| 27. | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු | 10 | 7 | | 3 |
| 28. | සිවිල් ඉංජිනේරු - (ශ්‍රී.ලං.ඉං.සේ.) | 1 | 0 | | 1 |
| 29. | කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු - (ශ්‍රී.ලං.ඉං.සේ.) | 14 | 14 | | 0 |
| 30. | රසායන ඉංජිනේරු | 2 | 2 | | 0 |
| 31. | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි (ශ්‍රී.ලං.වි.සේ.) | 1 | 1 | | 0 |
| 32. | පර්යේෂණ නිලධාරි (ශ්‍රී.ලං.වි.සේ.) | 3 | 2 | | 1 |

| | තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | අනියම් ආදේශක | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| 33. | සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.තො.ස.තා.සේ.) | 1 | 0 | | 1 |
| | එකතුව | 210 | 154 | 0 | 56 |
| **තෘතීය මට්ටම** | | | | | |
| 34 | පුස්තකාලයාධිපති (අධිශ්‍රේණිය) | 1 | 0 | | 1 |
| 35 | තාක්ෂණ නිලධාරී ශ්‍රී.ලං.තා.සේ. විශේෂ පන්තිය | 1 | 0 | | 1 |
| 36 | ඇඟිලි සටහන් පරීක්ෂණ නිලධාරී. (විශේෂ පන්තිය ශ්‍රී.ලං.තා.සේ) | 1 | 0 | | 1 |
| 37 | කම්කරු නිලධාරී (අධිශ්‍රේණිය) | 56 | 0 | | 56 |
| 38 | ලේඛකාධිකාරී | 1 | 1 | | 0 |
| 39 | තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නිලධාරී | 3 | 2 | | 1 |
| 40 | භාෂා පරිවර්තක (සිංහල- ඉංග්‍රිසි) | 2 | 2 | | 0 |
| 41 | භාෂා පරිවර්තක (දෙමළ- ඉංග්‍රිසි) | 1 | 1 | | 0 |
| 42 | භාෂා පරිවර්තක (සිංහල දෙමළ) | 3 | 0 | | 3 |
| 43 | පරිපාලන නිලධාරී | 2 | 1 | | 1 |
| 44 | කම්කරු නිලධාරී | 597 | 519 | | 78 |
| | එකතුව | 668 | 526 | 0 | 142 |
| **ද්විතීය මට්ටම** | | | | | |
| 45 | ක්ෂේත්‍ර නිලධාරී | 10 | 8 | | 0 * |
| 46 | මානව සම්පත් සංවර්ධන නිලධාරී | 69 | 69 | | 0 * |
| 47 | සංවර්ධන නිලධාරී | 96 | 51 | | 45 |
| 48 | තාක්ෂණ නිලධාරී (සිවිල්) | 1 | 0 | | 1 |
| 49 | තාක්ෂණ නිලධාරී (විදුලි) | 1 | 1 | | 0 |
| 50 | ඇඟිලි සටහන් පරීක්ෂණ නිලධාරි | 5 | 4 | | 1 |
| 51 | පර්යේෂන සහකාර | 4 | 0 | | 4 |
| 52 | ගොඩනැගිලි පරීක්ෂක | 4 | 0 | 1 | 4 |
| 53 | සැලසුම් ශිල්පි | 3 | 2 | | 1 |
| 54 | පුස්තකාලයාධිපති | 4 | 3 | | 1 |
| 55 | කළමනාකරණ සහකාර සේවය | 1522 | 1172 | | 350 |
| 56 | ලිපිකරු(සේ. අ. අ. ) | 19 | 19 | | 0 * |

| | තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | අනියම් ආදේශක | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| 57 | ලසුලේඛක | 15 | 11 | 1 | 4 |
| 58 | ස්ථානභාර නිලධාරි | 4 | 3 | | 1 |
| 59 | නේවාසිකාගාර පාලිකා | 4 | 3 | | 1 |
| 60 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 9 | 8 | | 1 |
| 61 | ප්‍රවාහන නිලධාරි | 1 | 1 | | 0 |
| | එකතුව | 1771 | 1355 | 2 | 414 |
| ප්‍රාථමික මට්ටම | | | | | |
| 62 | රියදුරු | 89 | 82 | | 7 |
| 63 | විදුලි කාර්මික | 2 | 2 | | 0 |
| 64 | වඩු කාර්මික | 1 | 1 | | 0 |
| 65 | පයිප්ප වැද්දුම්කරු | 1 | 1 | | 0 |
| 66 | සංචාරක බංගලා භාරකරු | 5 | 4 | | 1 |
| 67 | කාර්යාල කාර්ය සහයක | 350 | 327 | | 23 |
| 68 | මුරකරු | 40 | 42 | | -2 ** |
| 69 | ලොරි පවිත්‍රකරු | 1 | 1 | | 0 |
| | **එකතුව** | 489 | 460 | | 29 |
| | **එකතුව** | 3138 | 2495 | 2 | 643 |

සටහන්

* රාජ්‍ය ආයතනවල අවශ්‍යතාවයන්හි සීමාවන් තුළ සේවක සංඛ්‍යා ගැලපීම නිර්දේශ කිරීම යටතේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/C/08/36/01-Vol 1 හා 2012.11.30 දිනැති ලිපියෙන් කම්කරු දෙපාර්තමේන්තුව සඳහා අනුමත කරන ලද නව කාර්ය මණ්ඩලය අනුව මෙම තනතුරු, තනතුර දරන්නාට පෞද්ගලික වන සේ හා පසුව අහෝසි වීමට යටත්ව ලබා දී ඇත.

** තාවකාලික, අනියම් (දෛනික), කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන ඇති සේවකයින් සඳහා 2015 අයවැය යෝජනා අනුව ස්ථිර පත්වීම් ප්‍රධානය කිරීම අනුව මුරකරු තනතුරු 8ක් අනුමත කර දෙන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත.